# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2113/16 - 2019 මාර්තු මස 05 වැනි අඟහරුවාදා - 2019.03.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 11/80 (6)

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2019 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2019 ආහාර (පරිරක්ෂණ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2020 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. කිසිදු තැනැත්තකු විසින් -

(අ) මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිරක්ෂණ ද්‍රව්‍ය හැර වෙනත් යම් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍යයක් ;

(ආ) මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිරක්ෂණ ද්‍රව්‍ය හැර වෙනත් යම් පරිරක්ෂණ ද්‍රව්‍යයක් අඩංගු යම් ආහාරයක්,

නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, බෙදා හැරීම, භාවිත කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

3. (මෙහි මින්මතු ''නිශ්චිත ආහාර'' යනුවෙන් සඳහන් කරනු ලබන) II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව සඳහන් කරන ලද යම් ආහාරයක (මෙහි මින්මතු ''අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍ය'' යනුවෙන් සඳහන් කරනු ලබන) එහි II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව

1A - PG 4409 — 2517 (2019/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සඳහන් කර ඇති වර්ගයක පරිරක්‍ෂණ ද්‍රව්‍ය ඇතුළත් විය හැකි හා තිබිය හැකි වන අතර එකී පරිරක්‍ෂණ ද්‍රව්‍යයේ භාවිතය එහි III වන තීරයේ අනුරූප සටහනෙහි දක්වා ඇති ප්‍රමාණයන්ට අනුකූලව විය යුතු ය.

4. යම් නිශ්චිත ආහාරයක් තුළ හෝ ඒ මත, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිරක්‍ෂණ ද්‍රව්‍ය දෙකක හෝ වැඩි ගණනක මිශ්‍රණයක් තිබිය හැක්කේ, එවැනි ආහාරයක අඩංගු එක් එක් පරිරක්‍ෂණ ද්‍රව්‍යවල ප්‍රමාණය, එම උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි එම ආහාරයට යෝග්‍ය එම පරිරක්‍ෂණ ද්‍රව්‍ය උපරිම ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශිත අවස්ථාවල දී, එම ප්‍රතිශතවල එකතුව සියය ඉක්මවා නොයන විට දී පමණක් වේ.

5. (අ) නිශ්චිත ආහාර එකක් හෝ ඊට වැඩි ගණනක් භාවිත කරමින් සංයුක්ත ආහාරයක් පිළියෙළ කිරීමේ දී එක් කරනු ලබන පරිරක්‍ෂණ ද්‍රව්‍යයක් :-

(i) ඒ සංයුක්ත ආහාරය සකස් කිරීමට භාවිත කළ යම් නිශ්චිත ආහාරයක අඩංගු වී තිබිය හැකි නම් ; සහ

(ii) යම් නිශ්චිත ආහාරයකට අදාළව II වන උපලේඛනයේ III වන තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති අවසරලත් අනුපාතයට වඩා වැඩි නොවන අනුපාතයකින් ඒ සංයුක්ත ආහාරයේ අඩංගු වන්නේ නම් ; සහ

(ආ) යම් සංයුක්ත ආහාරයක් නිශ්චිත ආහාරයක් වන්නේ නම් සහ මෙහි III වන තීරයෙහි නිශ්චිතව සඳහන් කර ඇති අනුපාතයට වැඩි නොවන අනුපාතයකින් ඒ පරිරක්ෂණ ද්‍රව්‍යය එහි අඩංගු වන්නේ නම්,

ඒ සංයුක්ත ආහාරයේ එම අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍ය අඩංගු විය හැකි ය.

6. (අ) ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ආහාර ආකලන ද්‍රව්‍ය පිළිබඳ ඒකාබද්ධ විශේෂඥ කමිටුවේ (JECFA) ආහාර ආකලන ද්‍රව්‍ය පිළිබඳ චක්‍රලේඛවල සංයුක්ත සංග්‍රහය මගින් නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූල වන්නේ නම් මිස ; සහ

(ආ) මෙහි III වන උපලේඛනයේ (1) වන හා (2) වන ඡේදවල අඩංගු නියමයන්ට අනුකූල වූ ලේබලයක් සහිත භාජනයක ඇත්නම් හැර,

කිසිඳු තැනැත්තකු විසින්, ආහාර සකස් කිරීමේ දී අඩංගු ද්‍රව්‍යයක් ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා (වෙනත් යම් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍රකර ඇත්තා වූ යම් අවසරලත් පරිරක්ෂක ද්‍රව්‍යයක් ද ඇතුළුව) යම් අවසරලත් පරිරක්‍ෂණ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, බෙදා හැරීම, භාවිත කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

7. පටහැනි අදහසක් ප්‍රකාශ වුවහොත් මිස, මෙම නියෝගවල සඳහන් සියලු අනුපාතයන්, නිෂ්පාදිත ද්‍රව්‍යයේ බර අනුව ගණනය කරන ලද අනුපාතයන් වේ.

8. මේ නියෝගවල නිශ්චිතව සඳහන් කර ඇති අවසරලත් පරිරක්‍ෂණ ද්‍රව්‍යයක් එකතු කර ඇති ආහාරයක් අඩංගු සෑම ආහාර බඳුනක හෝ ඇසුරුමක ම ලේබලයේ කලින් කළ සංශෝධනය කරන ලද හෝ ප්‍රතිස්ථාපනය කරන ලද පරිදි, 2005 ජනවාරි මස 19 වන දින අංක 1376/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝගවල දක්වා ඇති ආකාරයේ ප්‍රකාශයක් අඩංගුව තිබිය යුතු ය.

9. 1990 ජූනි මස 19 වන දින අංක 615/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1989 ආහාර (පරිරක්ෂණ ද්‍රව්‍ය) නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

10. මේ නියෝගවල -

''පරිරක්ෂණ ද්‍රව්‍ය'' යන්නෙන්, යම් ආහාරයක ක්ෂුද්‍ර ජීවීන් හේතුවෙන් ඇතිවන ආහාර නරක්වීමට එරෙහිව ක්‍රියා කරමින් එම ආහාරය භාවිත කළ හැකි කාලය දීර්ඝ කරන ආහාර ආකලන ද්‍රව්‍යයක් අදහස් වේ.

''සංයුක්ත ආහාරය'' යන්නෙන්, සංඝටක දෙකක් හෝ ඊට වැඩි ගණනක් අඩංගු වන ආහාර අදහස් වේ.

## I වන උපලේඛනය

### *අවසරලත් පරිරක්‍ෂණ ද්‍රව්‍ය*

| *I වන තීරුව* | | *II වන තීරුව* | |
|---|---|---|---|
| අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යය | ජාත්‍යන්තර අංකන ක්‍රමය අනුව අංකය (INS) No | අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යය උපයෝගී කරගත හැකි විකල්ප ක්‍රම (I වන තීරුවේ දක්වා ඇති අවසරලත් ආහාර පරිරක්ෂණ ද්‍රව්‍ය පරිදි ගණනය කළ යුතු ය.) | ජාත්‍යන්තර අංකන ක්‍රමය අනුව අංකය (INS) No |
| 1. සෝබික් ඇසිඩ් | 200 | සෝඩියම් සෝර්බේට් | 201 |
| | | පොටෑසියම් සෝර්බේට් | 202 |
| | | කැල්සියම් සෝර්බේට් | 203 |
| 2. බෙන්සොයික් ඇසිඩ් | 210 | සෝඩියම් බෙන්සොඒට් | 211 |
| | | පොටෑසියම් බෙන්සොඒට් | 212 |
| | | කැල්සියම් බෙන්සොඒට් | 213 |
| 3. සල්ෆර් ඩයොක්සයිඩ් | 220 | සෝඩියම් සල්ෆයිට් | 221 |
| | | සෝඩියම් හයිඩ්‍රජන් සල්ෆයිට් | 222 |
| | | සෝඩියම් මෙටාබයිසල්ෆයිට් | 223 |
| | | පොටෑසියම් මෙටාබයිසල්ෆයිට් | 224 |
| | | පොටෑසියම් සල්ෆයිට් | 225 |
| | | පොටෑසියම් හයිඩ්‍රජන් සල්ෆයිට් | 228 |
| | | කැල්සියම් සල්ෆයිට් | 226 |
| | | කැල්සියම් හයිඩ්‍රජන් සල්ෆයිට් | 227 |
| 4. ඕතොපෙනිල්පීනෝල් | 231 | සෝඩියම් ඕතොපෙනිල්පීනේට් | 232 |
| 5. නයිසින් | 234 | | |
| 6. පොටෑසියම් නයිට්‍රයිට් | 249 | | |
| 7. සෝඩියම් නයිට්‍රයිට් | 250 | | |
| 8. ප්‍රොපියොනික් ඇසිඩ් | 280 | සෝඩියම් ප්‍රොපියොනේට් | 281 |
| | | කැල්සියම් ප්‍රොපියොනේට් | 282 |
| | | පොටෑසියම් ප්‍රොපියොනේට් | 283 |

**II වන උපලේඛනය**

**පළමුවන උපලේඛනයේ I හා II වන තීරුවල නිශ්චිතව දක්වා ඇති පරිදි අවසරලත් පරිරක්‍ෂණ ද්‍රව්‍ය අඩංගු විය හැකි ආහාර ද්‍රව්‍ය සහ ඒ ඒ ආහාරයේ අඩංගු අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යයේ ස්වභාවය හා ප්‍රමාණය**

| | *I වන තීරුව* | *II වන තීරුව* | *III වන තීරුව* |
|---|---|---|---|
| | නිශ්චිත ආහාර | අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍ය | අවසරලත් උපරිම ප්‍රමාණය (කිලෝග්‍රෑමයට මිලිග්‍රෑම්) (mg/kg) |
| 1.0 | **කිරි නිෂ්පාදන** | | |
| (අ) | රස කළ හෝ පැසවන ලද කිරි ආශ්‍රිත බීම (උදා : චොකලට් කිරි, යෝගට් පානය, මෝරු ආශ්‍රිත බීම)<br><br>(*පැසවීමෙන් පසුව තාප පිළියමට ලක් කරනු ලබන රසකළ නිෂ්පාදන වලට භාවිත කිරීම සඳහා පමණක් වේ.) | සෝර්බේට් හෝ<br>ප්‍රොපියොනේට | 1000*<br>GMP |
| (ආ) | පෙර ඇසුරුම් කරන ලද, පෙති කපන ලද චීස් | සෝර්බේට් | 1000 |
| (ඇ) | මේරූ චීස්, සැකසූ චීස්, චීස් තැවරුම් සහ චීස් පේස්ට් | සෝර්බේට් හෝ<br>නයිසීන් හෝ<br>ප්‍රොපියොනේට | 3000<br>12<br>GMP |
| (ඈ) | කිරි ආශ්‍රිත තාප පිළියමකට ලක් නොකරන ලද අතුරුපස (උදා : රසකළ යෝගට්)<br>(*මුදවපු කිරි, පළතුරු රසකළ ජෙලි යෝගට් සහ ''X'' අඩංගු යෝගට් පමණක් වේ.)<br>(*පළතුරු යෝගට් සඳහා පමණක් වේ.) | සෝර්බේට් හෝ<br>සල්ෆයිට් හෝ<br>නයිසින් හෝ<br><br>ප්‍රොපියොනේට | 300*<br>50**<br>12<br><br>GMP |
| (ඉ) | රෙනින් එකතු කරන ලද කිරි (සාමාන්‍ය) | සෝර්බේට | 1000 |
| (ඊ) | බීම වර්ග සුදු පැහැගන්වන | සෝර්බේට | 200 |
| (උ) | කැටි ගැසුණු යොදය (සාමාන්‍ය) | නයිසින් හෝ<br>ප්‍රොපියොනේට | 10<br>GMP |
| (ඌ) | නොමේරූ චීස් | සෝර්බේට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>GMP |
| (එ) | චීස් කුඩු (නැවත සකස් කිරීම සඳහා) | ප්‍රොපියොනේට | GMP |

| | | | |
|---|---|---|---|
| (ඒ) | මෝරු චීස් | සෝර්බේට | 1000 |
| (ඔ) | මෝරු ප්‍රෝටීන චීස් | සෝර්බේට හෝ<br>නයිසින් හෝ<br>ප්‍රොපියොනේට | 3000<br>12<br>GMP |
| (ඕ) | දියර මෝරු සහ මෝරු නිෂ්පාදන | ප්‍රොපියොනේට | GMP |

**2.0 මේද තෙලෝදය ප්‍රධාන වශයෙන් තෙල් තුළ ජලය ආකාරයෙන්**

| | | | |
|---|---|---|---|
| (අ) | මේද තැවැරුම්, කිරි මේද තැවරුම් සහ මිශ්‍ර මේද තැවරුම් | සෝර්බේට් | 2000 |
| (ආ) | එළවළු සහ ඇට වර්ගවල පූරි සහ තැවරුම් (උදා : රටකජු බටර්)* (ශක්තිය අඩු කරන ලද නිෂ්පාදන සඳහා පමණක් වේ) | සෝර්බේට් හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1000*<br>300<br>GMP |

**3.0 පළතුරු, එළවළු සහ කෘත්‍රිම රසකාරක සහිත බීම**

**3.1 පළතුරු සහ පළතුරු නිෂ්පාදන**

| | | | |
|---|---|---|---|
| (අ) | මතුපිට පිළියම් කළ නැවුම් පළතුරු | සල්පයිට හෝ<br>ඕතොපෙනිල්පීනෝල් හෝ<br>සෝඩියම් ඕතෝපීනෝල් පීනේට් | 30<br>12<br>12 |
| (ආ) | වියලන ලද/විජලනය කරන ලද කළ පළතුරු | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 500<br>1000<br>GMP |
| (ඇ) | අධි ශීත කළ පළතුරු | සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 500<br>GMP |
| (ඈ) | සීනි දමා කැටි ගස්සන ලද, ස්ඵටික කරන ලද හෝ සීනි තවරන ලද පළතුරු සහ පැඟිරි ලෙලි | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 500<br>100<br>GMP |
| (ඉ) | විනාකිරි, තෙල් හෝ ලුණු සහිත ජලයෙහි දමූ පළතුරු | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>100<br>GMP |
| (ඊ) | පළතුරු ආශ්‍රිත තැවරුම් (උදා : චට්නි) | සෝර්බේට හෝ<br>ප්‍රොපියොනේට | 300<br>GMP |
| (උ) | පල්ප, පූරි, පළතුරු ටොපින් සහ පොල් කිරි ඇතුළුව | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ | 1000<br>100 |

| | | | |
|---|---|---|---|
| | පළතුරු නිෂ්පාදන | ප්‍රොපියොනේට | GMP |
| (ඌ) | ජැම්, ජෙලි, මාමලේඩ් | සෝර්බේට හෝ<br>සල්පයිට (අවශේෂ $SO_2$ ලෙස)<br>ප්‍රොපියොනේට | 300<br>100<br>GMP |
| (එ) | සීනි අඩු හෝ සීනි රහිත ජැම්, ජෙලි සහ මාමලේඩ් | සෝර්බේට හෝ<br>සල්පයිට<br>(අවශේෂ $SO_2$ ලෙස)<br>ප්‍රොපියොනේට | 500<br>100<br><br>GMP |
| (ඒ) | පළතුරු රස කළ ජලය ආශ්‍රිත අතුරුපස ද ඇතුළුව පළතුරු ආශ්‍රිත අතුරුපස සහ ජෙලිකප්ස් | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 300<br>50<br>GMP |
| (ඔ) | පැසවන ලද පළතුරු නිෂ්පාදන | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>100<br>GMP |
| (ඕ) | පේස්ට්‍රි වර්ග සඳහා පළතුරු පිරවුම් | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>100<br>GMP |
| (ක) | පළතුරු යුෂ | සෝර්බේට හෝ<br>සල්පයිට | 300<br>50 |
| (ග) | පළතුරු යුෂ සාන්ද්‍ර (පරිභෝජකයාට පරිභෝජනයට සුදුසු ලෙස සකස් කරන ලද) | සෝර්බේට හෝ<br>සල්පයිට | 300<br>50 |
| (ච) | පළතුරු නෙක්ටා (පරිභෝජකයාට පිළිගන්වන පරිදි) | සෝර්බේට හෝ<br>සල්පයිට | 300<br>50 |
| (ජ) | පළතුරු නෙක්ටා සඳහා සාන්ද්‍ර (පරිභෝජකයාට පිළිගන්වන පරිදි) | සෝර්බේට හෝ<br>සල්පයිට | 300<br>50 |
| (ට) | ජලය මිශ්‍ර කිරීමෙන් පසුව පරිභෝජනය කිරීම සඳහා, නෙල්ලි, ඉඟුරු සහ දෙහි සඳහා 15% ක් හැර පළතුරු යුෂ 25% කට නොඅඩුව අඩංගු වන සහ මුළු ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය ප්‍රමාණය m/m 40% කට අඩු නොවන, පළතුරු කෝඩියල් සහ මිරිකාගත් යුෂ | සෝර්බේට හෝ<br>සල්පයිට | 1500<br>250 |
| (ඩ) | ජලය මිශ්‍ර කිරීමෙන් පසුව පරිභෝජනය කිරීම සඳහා, නෙල්ලි ඉඟුරු සහ දෙහි සඳහා 30% ක් හැර පළතුරු යුෂ m/m 50% කට නොඅඩුව අඩංගු වන සහ මුළු ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය ප්‍රමාණය m/m 62% ට අඩු නොවන, මිරිකාගත් පළතුරු යුෂ සාන්ද්‍ර | සෝර්බේට හෝ<br>සල්පයිට | 3000<br>500 |

| | | | |
|---|---|---|---|
| (ඣ) | ජලය මිශ්‍ර කිරීමක් නොමැතිව පරිභෝජනය කිරීම සඳහා පළතුරු යුෂ m/m 5% ට නොඅඩුව අඩංගු වන සහ මුළු ද්‍රාව්‍ය ඝණ ද්‍රව්‍ය ප්‍රමාණය 16% ට වැඩි නොවන පළතුරු බීම | සෝර්බේට හෝ<br>සල්පයිට | 300<br>50 |
| (ත) | කර්මාන්ත භාවිතය සඳහා සාන්ද්‍ර පළතුරු යුෂ | සල්පයිට | 1500 |
| **3.2** | **ජලය ආශ්‍රිත රසකළ බීම** | | |
| (අ) | ජලය මිශ්‍ර කිරීමෙන් පසුව පරිභෝජනය කිරීම සඳහා, (සුක්‍රෝස් ලෙස ගණනය කරන ලද) සීනි 25% කට නොඅඩුව අඩංගු වන කෘත්‍රිම ලෙස රස කළ කෝඩියල් | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1500<br>250<br>GMP |
| (ආ) | ජලය මිශ්‍ර කිරීමෙන් තොරව පරිභෝජනයට ගැනීම සඳහා සුදුසු, සීනි (සුක්‍රෝස ලෙස ගණනය කරන ලද) 5% කට නොඅඩුව අඩංගු වන කෘත්‍රිම ලෙස රස කළ බීම | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 300<br>50<br>GMP |
| (ඇ) | ජලය ආශ්‍රිත රස කළ කාබනීකෘත බීම | සෝර්බේට හෝ<br>බෙන්සොඒට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 300<br>120<br>50<br>GMP |
| (ඈ) | කෘතිම ලෙස රස කළ සිරප් සාන්ද්‍ර | සෝර්බේට හෝ<br>බෙන්සොඒට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1500<br>600<br>250<br>GMP |

**3.3 නතු, මුල්, අල, මාෂ බෝග, රනිල බෝග සහ ඇටවර්ග ඇතුළුව එළවළු සහ එළවළු නිෂ්පාදන**

| | | | |
|---|---|---|---|
| (අ) | පොතු අරින ලද, කැපූ හෝ තීරු කපන ලද නැවුම් එළවළු (*අර්තාපල් වලට යොදා ගැනීම සඳහා පමණක් වේ.) | සල්පයිට | 50* |
| (ආ) | අධිශීත කළ එළවළු (* අර්තාපල් වලට යොදා ගැනීම සඳහා පමණක් වේ) | සල්පයිට | 50* |
| (ඇ) | වියලන ලද/විජලනය කරන ලද එළවළු | සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 500<br>GMP |
| (ඈ) | විනාකිරි, තෙල්, ලුණු වතුර, හෝ සෝයා සෝස්වල දැමූ එළවළු | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>100<br>GMP |

| | | | |
|---|---|---|---|
| (ඉ) | එළවළු පල්ප සහ සැකසුම් (උදා : එළවළු අතුරුපස සහ සෝස්, සීනි යොදා කැටි ගැස්වූ එළවළු) (*අර්තාපල් වලට යොදා ගැනීම සඳහා පමණක් වේ) | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>300*<br>GMP |
| (ඊ) | පැසුණු සෝයා බෝංචි නිෂ්පාදන හැර පැසුණු එළවළු | සෝර්බේට හෝ<br>සල්පයිට | 1000<br>500 |
| (උ) | එළවළු යුෂ | සල්පයිට | 50 |
| (ඌ) | එළවළු යුෂ සාන්ද්‍ර (පරිභෝජකයාට පිළිගන්වන පරිදි) | සල්පයිට | 50 |
| (එ) | එළවළු නෙක්ටා (පරිභෝජකයාට පිළිගන්වන පරිදි) | සල්පයිට | 50 |
| (ඒ) | එළවළු නෙක්ටා සඳහා සාන්ද්‍ර (පරිභෝජකයාට පිළිගන්වන පරිදි) | සල්පයිට | 50 |
| (ඔ) | කර්මාන්ත භාවිතය සඳහා එළවළු යුෂ | සල්පයිට | 1000 |
| (ඕ) | කර්මාන්ත භාවිතය සඳහා සාන්ද්‍ර එළවළු යුෂ | සල්පයිට | 1500 |
| (ක) | අච්චාරු | සෝර්බේට හෝ<br>සල්පයිට | 1000<br>100 |
| (ග) | දිසිදි පොල් සහ පොල් පේස්ට් | සල්පයිට | 50 |

**4.0 කාබෝහයිඩ්‍රේට, ධාන්‍ය වර්ග සහ ඒවායේ නිෂ්පාදන**

**4.1 කාබෝහයිඩ්‍රේට**

| | | | |
|---|---|---|---|
| (අ) | කිරි වැරීමේදී සහ ඉන්පසු දෙනු ලබන ආහාර සහ ළදරු ආහාර සඳහා භාවිතා කරන පිටි හැර, පිෂ්ඨ හා පිටි වර්ග | සෝර්බේට හෝ<br>සල්පයිට | 1000<br>50 |
| (ආ) | පිටි | සල්පයිට | 200 |
| (ඇ) | සුදු සීනි, පර්ක්ටෝස්, ග්ලූකොස්, අයිසින් සීනි, කුඩු කරන ලද ඩෙක්ස්ට්‍රෝස් | සල්පයිට | 15 |
| (ඈ) | වගා කරන සහ ඇඹරුම් සුදු සීනි | සල්පයිට | 70 |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දුඹුරු සීනි | සල්පයිට | 40 |
| (ඊ) | සීනි ද්‍රාවන සහ සිරප්, පැණි සහ මොලැසස් ද ඇතුළුව අර්ධ වශයෙන් අපවර්තිත සීනි | සල්පයිට | 70 |
| (උ) | අනෙකුත් සීනි සහ සිරප් උදා :- (සයිලෝස්, මේපල් සිරප්, සීනි ටොපින්ස්) | සල්පයිට | 40 |
| (ඌ) | ග්ලූකෝස් සිරප් සහ වියළි ග්ලූකෝස් සිරප් | සල්පයිට | 20 |
| (එ) | නිෂ්පාදන කාර්යයන් සඳහා ග්ලූකොස් සිරප් | සල්පයිට | 400 |
| (ඒ) | නිෂ්පාදන කාර්යයන් සඳහා වියලි ග්ලූකොස් සිරප් | සල්පයිට | 150 |

4.2 ධාන්‍ය වර්ග සහ ධාන්‍ය නිෂ්පාදන

| | | | |
|---|---|---|---|
| (අ) | ධාන්‍ය වර්ග සහ පිෂ්ඨය ආශ්‍රිත අතුරුපස | සෝර්බේට හෝ<br>නයිසින්<br>ප්‍රොපියොනේට | 300<br>3<br>GMP |
| (ආ) | පාන් සහ වෙනත් බේකරි නිෂ්පාදන | ප්‍රොපියොනේට | GMP |
| (ඇ) | පැණිරස ක්‍රැකර් හැර විස්කෝතු සහ තුනී අනිකුත් ක්‍රැකර් | සෝර්බේට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>GMP |
| (ඈ) | කේක්, කුකීස්, පයිස්, ඩෝනට් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන | සෝර්බේට හෝ<br>ප්‍රොපියොනේට | 300<br>GMP |

4.3 රස කැවිලි

| | | | |
|---|---|---|---|
| (අ) | ග්ලූකෝස සිරප් ආශ්‍රිත රස කැවිලි | සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 50<br>GMP |
| (ආ) | චුවින්ගම් සහ බබල්ගම් | සෝර්බේට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>GMP |

5.0 බිත්තර, මාළු, කුකුළු මස් සහ ඒවායේ නිෂ්පාදන

5.1 බිත්තර, මාළු සහ ඒවායේ නිෂ්පාදන

| | | | |
|---|---|---|---|
| (අ) | වියළි සහ/හෝ තාපය මගින් කැටිගන්වන ලද බිත්තර නිෂ්පාදන | සෝර්බේට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>GMP |
| (ආ) | නැවුම් කබලු මත්ස්‍යයින්, මොලුසකාවන් සහ ශෛල චර්මීන් | සල්පයිට | 100 |
| (ඇ) | අධිශීත කළ කබලු මත්ස්‍යයින්, මොලුසකාවන් සහ ශෛල | සල්පයිට | 100 |

වර්මීන්

**5.2 මස්, කුකුල් මස් සහ ඒවායේ නිෂ්පාදන**

| | | | |
|---|---|---|---|
| (අ) | හැම් සහ බේකන් | නයිට්‍රයිට | 80 |
| (ආ) | මීට් බෝල්ස්, සොසේජස්, බර්ගර්, චිකන් රෝල්, ටින් කළ මස් ඇතුළු තාප පිළියම් කළ, සැකසූ, අඹරන ලද මස් සහ කුකුළු මස් නිෂ්පාදන | නයිට්‍රයිට | 80 |
| (ඇ) | ටින් කළ කෝන්මීට් | නයිට්‍රයිට | 80 |

**6.0 සෝස් වර්ග, සුප් වර්ග සහ විවිධ අයිතම**

**6.1 සෝස් වර්ග සහ ඒ හා සමාන නිෂ්පාදන**

| | | | |
|---|---|---|---|
| (අ) | තෛලෝද කාරක සෝස් වර්ග (උදා : සලාද, සැරසිලි, මයොනීස්) | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>300<br>GMP |
| (ආ) | තෛලෝද කාරක නොවන ලද සෝස් වර්ග (උදා : කෙචප්, චීස් සෝස්, ක්‍රීම් සෝස්, බ්‍රවුන් ග්‍රේවි) සෝස් වර්ග හා ග්‍රේවි වර්ග සඳහා මිශ්‍රණ සහ අමිශ්‍ර සෝස් වර්ග (උදා : මාළු සෝස්) | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>300<br>GMP |
| (ඇ) | කොකෝවා ආශ්‍රිත තැවරුම් සහ එළවළු සහ ඇටවර්ගවල තැවරුම් හැර සැන්ඩ්විච් තැවරුම් | සෝර්බේට හෝ<br>ප්‍රොපියොනේට | 300<br>GMP |

**6.2 සුප් වර්ග**

| | | | |
|---|---|---|---|
| | සුප් මිශ්‍රණ | සෝර්බේට හෝ<br>ප්‍රොපියොනේට | 300<br>GMP |

**6.3 විවිධ**

| | | | |
|---|---|---|---|
| (අ) | සූපවේදී ශාක පැළෑටි සහ කුළුබඩු | සල්පයිට | 150 |
| (ආ) | විශේෂ වෛද්‍ය හේතුන් සඳහා වූ පෝෂණවේදී ආහාර | සෝර්බේට හෝ<br>ප්‍රොපියෝනේට | 1500<br>GMP |
| (ඇ) | ශරීරය කෙට්ටු කර ගැනීම සහ බර අඩු කර ගැනීම සඳහා පෝෂණවේදී වට්ටෝරු | සෝර්බේට හෝ<br>ප්‍රොපියෝනේට | 1500<br>GMP |
| (ඈ) | ළදරුවන් සහ කුඩා දරුවන් සඳහා වූ ආහාර නොවන පෝෂණවේදී ආහාර (උදා : පෝෂණවේදී භාවිතය සඳහා පරිපූරක ආහාර) | සෝර්බේට හෝ<br>ප්‍රොපියොනේට | 1500<br>GMP |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පරිපූරක ආහාර | සෝර්බේට හෝ<br>ප්‍රොපියෝනේට | 2000<br>GMP |
| (ඊ) | සෝයා බෝංචි නිෂ්පාදන<br>(උදා : ටෝෆු, සෝයා සෝස්) | සෝර්බේට හෝ<br>ප්‍රොපියෝනේට | 1000<br>GMP |
| (උ) | කුළු බඩු පේස්ට් | සෝබේට හෝ<br>සල්පයිට | 300<br>100 |
| (ඌ) | අර්තාපල්, ධාන්‍ය, පිටි හෝ පිෂ්ඨය ආශ්‍රිත (මුල සහ අල, මාෂ භෝග හා රනිල භෝග ඇට වලින් ලබා ගනු ලබන) සුළු ආහාර වර්ග | සෝර්බේට හෝ<br>සල්පයිට හෝ<br>ප්‍රොපියොනේට | 1000<br>50<br>GMP |
| (එ) | ආලේපිත ඇට වර්ග සහ ඇට වර්ග මිශ්‍රණ ඇතුළුව, සැකසූ ඇට වර්ග (ස්නැක්ස් සහ බයිට් වර්ග)<br>(උදා : වියළි පළතුරු සමග) | ප්‍රොපියොනේට | GMP |
| (ඒ) | මාළු ආශ්‍රිත සුළු ආහාර වර්ග | ප්‍රොපියොනේට | GMP |

## III වන උපලේඛනය

1. 3 වන නියෝගය අදාළ වන්නා වූ එක් එක් බඳුන හෝ ඇසුරුම -

(අ) එක් එක් අවසරලත් පරිරක්‍ෂණ ද්‍රව්‍යයේ, පොදු නාමයන් සහ ජාත්‍යන්තර අංකන ක්‍රමය (INS) අනුව අංකයන් ;

(ආ) ද්‍රව්‍ය එකකට වඩා වැඩි ගණනක් අඩංගු වන අවස්ථාවක දී, පොදු නාමය සහ ජාත්‍යන්තර අංකන ක්‍රමය (INS) අනුව අංකය ;

(ඇ) යම් අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යයන් යම් තනුකාරකයක් සමග මිශ්‍ර කර ඇති අවස්ථාවක දී, එම තනුක මිශ්‍රණයේ පවතින තනුකාරකයේ සහ අවසරලත් පරිරක්ෂණ ද්‍රව්‍යයේ ප්‍රතිශත ;

දැක්වෙන ප්‍රකාශනයක් අඩංගු ලේබලයක් සහිත විය යුතු ය.

2. 1 වන ඡේදය ප්‍රකාරව මුද්‍රණය කිරීමට/ඇලවීමට අවශ්‍ය වන ඕනෑම ප්‍රකාශනයක් -

(අ) පැහැදිලි හා පහසුවෙන් කියවිය හැකි විය යුතු ය ;

(ආ) බඳුනේ හෝ ඇසුරුමේ සුරක්ෂිතව අලවා ඇති ලේබලයේ කැපී පෙනෙන ස්ථානයක සුරක්ෂිතව අලවා හෝ මුද්‍රණය කර තිබිය යුතු අතර, ආහාර මිල දී ගැනීමට අදහස් කරන ගැනුම්කරුවකුට පහසුවෙන් කියවා තේරුම් ගත හැකි ආකාරයකට තිබිය යුතු ය ;

(ඇ) වෙනත් යම් දෙයකින් සඟවනු ලැබ හෝ නොපැහැදිලි ලෙස දර්ශන වන පරිදි හෝ නොතිබිය යුතු ය.

03 - 934

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.